# ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 35 දරන රේගු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1974 ඔක්තෝබර් මස 8 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1974 ඔක්තෝබර් මස 25 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 35 දරන රේගු
(සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1974 ඔක්තෝබර් මස 8 වන දින]

එල්. ඩී.—ඕ. 34/67

**රේගු ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 35 දරන රේගු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

(2) ප්‍රධාන ප්‍රඥප්තියේ 28, 29, 30, 33, 38, 43, 59, 63, 67, 68 (6), කරනු ලබන) රේගු ආඥාපනතේ 8 (2), 9 (2), 31, 35 සහ 56 වන වගන්ති අවස්ථාවෝචිත පරිදි, එහි දැක්වෙන දඩයේ නැතහොත් අහිමිකිරීමේ මුදල රුපියල් දහසක් වූවාක් මෙන් බල පැවැත්විය යුතු ය. 235 වන අධිකාරයේ ඇතැම් වගන්ති සංශෝධනය කිරීම.

(2) ප්‍රධාන ප්‍රඥප්තියේ 28, 29, 30, 33, 38, 43, 59, 63, 67, 68 (6), 77, 78, 100, 110, 119, 122, 126 (4), 135, 137, 138 සහ 139 වන වගන්ති අවස්ථාවෝචිත පරිදි එහි දැක්වෙන දඩයේ, අහිමිකිරීමේ නැතහොත් දණ්ඩනයේ මුදල රුපියල් දෙදහසක් වූවාක් මෙන් බල පැවැත්විය යුතු ය.

(3) ප්‍රධාන ප්‍රඥප්තියේ 42, 47, 57, 76, 96, 101 (1), 116 සහ 117 වන වගන්ති අවස්ථාවෝචිත පරිදි එහි ලා දැක්වෙන දඩයේ, අහිමිකිරීමේ නැතහොත් දණ්ඩනයේ මුදල රුපියල් සියයක් වූවාක් මෙන් බල පැවැත්විය යුතු ය.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්ති ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්ති ආදේශ කිරීමෙන් :—

'(1) 10 වන වගන්තිය යටතේ අපනයන තීරු බදු නියම කරන යම් යෝජනාවක් මගින්—

(අ) ලෝක වෙළෙඳ පොළෙහි භාණ්ඩවල මිල අඩු වැඩි වීමට අනුකූල ව වෙනස් වන ප්‍රමාණ අනුව භාණ්ඩ කිසිවක් සඳහා තීරු බදු නියම කළ හැකි අතර,

1—එ 09130—11,340 (74/08)

(ආ) ඒ යෝජනාව අදාළ කිරීමේ කාර්ය සඳහා එය අදාළ වන භාණ්ඩවල ලෝක වෙළෙඳ පොළෙහි මිල වශයෙන් සැලකිය යුතු මුදල අයකැමි විසින් කලින් කල තක්සේරු කිරීම සඳහා විධිවිධාන සැලැස්විය හැකි ය.

(2) ලෝක වෙළෙඳ පොළෙහි භාණ්ඩවල මිල අඩු වැඩි වීමට අනුකූල ව වෙනස් වන ප්‍රමාණ අනුව ඒ භාණ්ඩ සඳහා මේ වගන්තියෙහි (1) වන උපවගන්තිය ප්‍රකාර අපනයන තීරු බදු යම් යෝජනාවක් මගින් නියම කරනු ලබන අවස්ථාවක, (මෙහි මින් මතු "අපනයනකරු" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකාවේ විකුණුම්කරුවකු හා එතෙර ගැනුම්කරුවකු අතර ඇති කර ගන්නා ලද ඒ භාණ්ඩ අපනයනය කිරීමේ කොන්ත්‍රාත්තුවක් සම්බන්ධයෙන් පහත සඳහන් විධිවිධාන බලපැවැත්විය යුතු ය:—

(අ) (i) කොන්ත්‍රාත්තුවෙන් ආරක්ෂිත භාණ්ඩවල සම්පූර්ණ ප්‍රමාණය ;

(ii) කොන්ත්‍රාත්තුවේ නියමයන් අනුව ඒ භාණ්ඩ අපනයනය කිරීමට නියමිත (මෙහි මින් මතු "අපනයනය කිරීමේ යෝජිත කාලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කාලය ; සහ

(iii) අයකැමි විසින් නියම කරනු ලැබිය හැකි වෙනත් විස්තර,

ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කරමින්, අපනයනකරු විසින් අයකැමි වෙත කොන්ත්‍රාත්තුව ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකි ය ;

(ආ) එවැනි යම් කොන්ත්‍රාත්තුවක් (3) වන සහ (4) වන උපවගන්තිවල විධිවිධානවලට යටත් ව අයකැමි විසින් ලියාපදිංචි කළ හැකි ය ;

(ඇ) එවැනි යම් කොන්ත්‍රාත්තුවක් ලියාපදිංචි කරනු ලැබූ අවස්ථාවක, ඒ භාණ්ඩ සඳහා අපනයන තීරු බදු නියම කිරීමේ යෝජනාවෙහි ඇති කිසිවක් නො තකා, කොන්ත්‍රාත්තුව සපුරාලීමෙහි ලා අපනයනය කිරීමේ යෝජිත කාලය තුළ අපනයනය කිරීමට යන භාණ්ඩ බවට අයකැමි සෑහීමට පත් වන පරිදි ඔප්පු කරනු ලැබූ භාණ්ඩ සියල්ල සඳහා, ඒ

කොන්ත්‍රාත්තුව ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයේ දිනයෙහි ඒ භාණ්ඩ අපනයනය කරනු ලැබී නම් ඊට අදාළ කරනු ලැබිය හැකි වූ ප්‍රමාණය අනුව තීරු බදු නියම කොට අය කර ගෙවනු ලැබිය යුතු ය.';

(2) ඒ වගන්තියේ (5) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

'(5) (2) වන උපවගන්තියෙහි විධිවිධාන සලසා ඇති පරිදි කොන්ත්‍රාත්තුවක් ලියාපදිංචි කරනු ලැබ ඒ සම්පූර්ණ කොන්ත්‍රාත්තුව හෝ ඉන් කොටසක් සපුරාලීම නොකර ඇති බව අපනයනය කිරීමේ යෝජිත කාලය ඉකුත් වන දිනයෙහි දී දැනගන්නා යම් අවස්ථාවක (1) වන උප වගන්තිය ප්‍රකාර සම්මත කර ගන්නා ලද යෝජනාව යටතේ අපනයනය කිරීමේ යෝජිත කාලය තුළ පැවැති (මෙහි මින් මතු "අලුත් ප්‍රමාණය" යනුවෙන් සඳහන් කරනු ලබන) අඩුම තීරු බදු ප්‍රමාණය කොන්ත්‍රාත්තුව ලියා පදිංචි කිරීම සඳහා ඉල්ලුම් කළ දිනයෙහි ඒ යෝජනාව යටතේ පැවැති (මෙහි මින් මතු "කලින් පැවැති ප්‍රමාණය" යනුවෙන් සඳහන් කරනු ලබන) ප්‍රමාණයට වඩා අඩු නම්—

(අ) කොන්ත්‍රාත්තුව සපුරාලීම නොකර තිබෙන්නේ යම් භාණ්ඩ ප්‍රමාණයක් සම්බන්ධයෙන් ද ඒ භාණ්ඩ ප්‍රමාණය වෙනුවෙන් කලින් පැවැති ප්‍රමාණය අනුව අපනයන තීරු බදු වශයෙන් ගෙවනු ලැබිය යුතුව තිබුණු මුදලෙහි තක්සේරුවක් සහ එකී භාණ්ඩ ප්‍රමාණය වෙනුවෙන් අලුත් ප්‍රමාණය අනුව අපනයන තීරු බදු වශයෙන් ගෙවිය යුතු වන මුදලෙහි තක්සේරුවක් රේගු අයකැමි විසින් කළ යුතු ය ; තවද

(ආ) එසේ තක්සේරු කරන ලද මුදල් ප්‍රමාණ දෙකෙහි වෙනසට සමාන මුදලක්, ඒ කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් (4) වන උපවගන්තිය යටතේ අපනයනකරු විසින් තැන්පත් කරන ලද මුදලින් අඩු කර ගත යුතු යැයි හෝ අවස්ථාවෝචිත පරිදි ඒ කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් ඒ උපවගන්තිය ප්‍රකාර බැඳුම්කරය ලියා අත්සන් කළ බැංකුව විසින් ගෙවනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරමින් රේගු අයකැමි විසින් නියමයක් කළ යුතු ය.

යම් කොන්ත්‍රාත්තුවක් සම්බන්ධයෙන් මේ උප වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ ගෙවීමට නියම කරනු ලැබූ මුදල ඒ කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් (4) වන උපවගන්තිය යටතේ තැන්පත් කරනු ලැබූ මුළු මුදල හෝ අවස්ථාවෝචිත පරිදි, ඒ කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් ඒ උපවගන්තිය ප්‍රකාර ලියා අත්සන් කරන ලද බැඳුම්කරයෙහි සඳහන් මුළු මුදල ඉක්මවී නම්, එසේ ගෙවීමට නියම කරන ලද මුදල සහ ඇප වශයෙන් තැන්පත් කරන ලද මුදල හෝ ඒ උපවගන්තියේ නියමයන් ප්‍රකාර අපනයනකරු විසින් ඒ මුදල ගෙවනු ලැබීම සඳහා අයකැමි වෙත ලියා අත්සන් කර දෙන ලද බැඳුම්කරයෙහි සඳහන් මුදල අතර ඇති වෙනසට සමාන මුදලක් ඒ නියමයෙහි දක්වෙන කාලය තුළ අපනයනකරු විසින් ගෙවිය යුතු යැයි අයකැමි විසින් තවදුරටත් නියම කළ යුතු ය. එකී මුදල ගෙවනතුරු අපනයනකරුට අයත් භාණ්ඩ කිසිවක් යැවීමට ඉඩදීම රේගු නිලධරයන් විසින් ප්‍රතික්ෂේප කිරීම නිත්‍යානුකූල විය යුතු ය.

යම් මුදලක් බැංකුවක් විසින් ගෙවනු ලැබිය යුතු බව ප්‍රකාශ කරමින් රේගු අයකැමි විසින් මේ උපවගන්තිය යටතේ නියමයක් කරනු ලැබූ කල්හි, ඒ මුදල අයකැමි ඉල්ලූ විට එය අයකැමිට ගෙවීමට බැංකුව එවිට ම බැඳී සිටින්නේ ය.';

(3) ඒ වගන්තියේ (13) වන උපවගන්තියෙහි "අයකැමි" යන්නෙහි අර්ථ කථනය අත්හැරීමෙන් ; සහ

(4) ඒ වගන්තියේ (14) වන සහ (15) වන උපවගන්ති ඉවත් කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

" වැඩිපුර ගෙවූ තීරු බදු, ගාස්තු සහ අයකිරීම් ආපසු ගෙවිය යුතු බව.

18. (1) යම් තැනැත්තකු විසින් ආනයනය කරන ලද හෝ අපනයනය කරන ලද භාණ්ඩ සඳහා ඔහුගෙන් නිසි පරිදි අය කළ හැකි මුදලට වඩා වැඩි තීරු බදු, ගාස්තු හෝ අය කිරීම් කිසිවක් ඔහු විසින් ගෙවා තිබෙන බව අයකැමි සෑහීමට පත් වන සේ යථා පරිදි ලියවිල්ලකින් කරනු ලබන යම් හිමිකම් පෑමක් මගින් ඔප්පු කරනු ලැබුවහොත් ඒ හිමිකම් පෑම ඒ ගෙවීමේ දින සිට මාස විසි හතරක් ඇතුළත කරනු ලැබී නම්, එසේ වැඩිපුර ගෙවන ලද මුදල ආපසු ලැබීමට ඒ තැනැත්තාට හිමිකම් ලැබිය යුතු ය.

(2) ආනයනය කරන ලද හෝ අපනයනය කරන ලද භාණ්ඩ කිසිවක් සඳහා ගෙවිය යුතු තීරු බදු, ගාස්තු හෝ අය කිරීම් කිසිවක් අඩුවෙන් අය කළ කල්හි, නැතහොත් එයින් යම් තීරු බදු, ගාස්තු හෝ අය කිරීම් කිසිවක් අය කිරීමෙන් පසුව වැරදීමකින් ආපසු ගෙවනු ලැබූ කල්හි, එසේ අඩුවෙන් අය කළ තීරු බදු, ගාස්තු හෝ අය කිරීම් ගෙවීමට යටත් තැනැත්තන් විසින් හෝ වැරදීමකින් එය එසේ ආපසු ගෙවනු ලැබූ තැනැත්තන් විසින්, අඩුවෙන් අය කළ හෝ වැරදීමකින් ආපසු ගෙවූ මුදල නැවත ගෙවන ලෙස ඒ අඩුවෙන් ගෙවීමේ හෝ ආපසු ගෙවීමේ දින සිට මාස විසි හතරක් ඇතුළත ඉල්ලා සිටිනු ලැබුවහොත්, අඩු පාඩුව ගෙවීම හෝ වැරදීමකින් ආපසු ගෙවූ මුදල ගෙවීම කළ යුතු ය.

(3) (2) වන උපවගන්තියේ නියමයන් ප්‍රකාර ගෙවන ලෙස ඉල්ලා සිටිනු ලැබූ මුදල එසේ ගෙවන ලෙස අයකැමි විසින් ඉල්ලා සිටිනු ලැබුයේ යම් තැනැත්තකුගෙන් ද, ඒ තැනැත්තා විසින් ගෙවනු නොලැබුවහොත්, ඒ තැනැත්තා විසින් ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන නොහොත් ගෙනෙනු ලබන හෝ ශ්‍රී ලංකාවෙන් අපනයනය කිරීමට නොහොත් ගෙන යෑමට බලාපොරොත්තු වන භාණ්ඩ කිසිවකට ඉඩ දීම රේගු නිලධරයන් විසින් ප්‍රතික්ෂේප කිරීම නීත්‍යනුකූල විය යුතු ය:

එසේ වුව ද ඒ මුදල අයකැමි විසින් වෙනත් යම්කිසි නීතියක විධිවිධාන යටතේ අයකර ගැනීම මේ උපවගන්තියෙහි පෙරාතුව වූ විධිවිධානවල සඳහන් කිසිවකින් තහනම් කෙරෙන ලෙස නොසැලකිය යුතු ය.".

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තියේ (5) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම.

" (5) මේ වගන්තියේ පෙරාතුව වූ විධිවිධාන යටතේ වූ යම් නියමයක කුමක් සඳහන් වුව ද, ඒ නියමය අදාළ කිසි ම භාණ්ඩයක් ප්‍රධාන රේගු අයකැමිගේ පූර්ව අවසරය නො මැතිව ද ඒ භාණ්ඩ සඳහා ගෙවිය යුතු තීරු බදු ඒ භාණ්ඩ විකිණීමේ හෝ බැහැර කිරීමේ වේලාවේදී ප්‍රධාන රේගු අයකැමි වෙත ගෙවනු ලැබී නම් මිස ද, විකිණීම හෝ අන් ලෙසකින් බැහැර කිරීම නො කළ හැකි ය. මේ උපවගන්තියේ පෙරාතුව වූ විධිවිධාන කඩ කරමින් විකුණන ලද හෝ බැහැර කරන ලද යම් භාණ්ඩයක් අහිමි කරනු ලැබීමට යටත් විය යුතු ය.".

19අ වන අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 19අ වන වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය:—

"ඇතැම් තැනැත්තන් විසින් ආනයනය කරනු ලබන භාණ්ඩ ආනයන තීරු බදුවලින් නිදහස් කිරීම.

19අ. (1) නියමයෙහි සඳහන් යම් තැනැත්තකු විසින් ආනයනය කරන ලද, නැතහොත් ඔහු නමට ප්‍රේෂණය කරන ලද යම් භාණ්ඩයක් නියමයෙහි සඳහන් විය හැකි (ඉවත් කර ගැනීමට පෙර හෝ පසුව ඔහු විසින් සපුරා ලිය යුතු) කොන්දේසිවලට යටත්ව, ඒ සඳහා අය කළ යුතු රේගු තීරු බදු සියල්ලෙන් හෝ ඉන් කොටසකින් නිදහස් කිරීම පොදු යහපත සඳහා යෝග්‍ය යයි අමාත්‍යවරයා විසින් සලකනු ලැබේ නම්, ඔහු විසින් එසේ කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියමයක් ම, ඒ නියමයේ දින සිට වලංගු විය යුතු ය. ඒ සෑම නියමයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි තාක් ඉක්මණින් එය ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය. අමාත්‍යවරයා විසින් මේ වගන්තිය යටතේ සාදන ලද යම් නියමයක් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු දවස් හැටක් ඇතුළත ජාතික රාජ්‍ය සභාව විසින් ඒ නියමය යෝජනා සම්මතයක් මගින් ප්‍රත්‍යාදිෂ්ට කළ හැකි ය. ඒ දවස් හැටේ කාලය ගණන් ගැනීමේ දී, ජාතික රාජ්‍ය සභාව වාරාවසාන කර තිබෙන හෝ විසුරුවා හරිනු ලැබ තිබුණු යම් කාලයක් ගණන් නොගත යුතු ය. එසින් යම් නියමයක් එසේ ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ අවස්ථාවක, නිදහස් කරනු ලැබූ භාණ්ඩ සඳහා ගෙවිය යුතු රේගු තීරු බදු ඒ භාණ්ඩවල ආනයනකරු විසින් හෝ ප්‍රේෂණලාභියා විසින් ප්‍රධාන රේගු අයකැමි වෙත ගෙවිය යුතු අතර, ඒ තීරු බදු 145 වන වගන්තියේ විධිවිධාන යටතේ අය කර ගත හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ වූ නියමයක සඳහන් භාණ්ඩ කිසිවක් ඒ නියමයේ කොන්දේසිවලට පටහැනිව පසුව විකුණනු ලැබූ හෝ බැහැර කරනු ලැබූ අවස්ථාවක, නීතිය මගින් ඊට සමාන භාණ්ඩ සඳහා අය කළ හැකි රේගු තීරු බදුවලට ම ඒ භාණ්ඩ ද යටත් කරනු ලැබිය යුතු අතර, ආනයනකරු විසින් හෝ යම් තැනැත්තකු විසින් හෝ වෙනුවෙන් ඒ භාණ්ඩ විකුණනු ලැබී ද නැතහොත් බැහැර කරනු ලැබී ද ඒ තැනැත්තා විසින් ඒ විකිණීමට හෝ බැහැර කිරීමට පෙර ප්‍රධාන රේගු අයකැමිගේ අවසරය ලබා ගෙන ඒ භාණ්ඩ සඳහා ගෙවිය යුතු තීරු බදු එසේ විකුණන හෝ බැහැර කරන වේලාවෙහි ප්‍රධාන අයකැමි වෙත ගෙවිය

යුතු ය. ඒ වගන්තිය කඩ කරමින් විකුණනු ලැබූ හෝ බැහැර කරනු ලැබූ භාණ්ඩ කිසිවක් අහිමි කරනු ලැබීමට යටත් විය යුතු ය.".

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි අතුරු විධානය වෙනුවට පහත සඳහන් අලුත් අතුරු විධානය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— *ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කිරීම.*

"එසේ වුව ද, ඒ ද්‍රව්‍ය ඉහත කී ලෙස ආනයනය කිරීමට හෝ මිල දී ගැනීමට හෝ අපනයනය කිරීමට හේතු වූ කාර්යය සඳහා අවශ්‍ය නො වී නම්, ඒ කිසි ම ද්‍රව්‍යයක්, ප්‍රධාන අයකැමිගේ පූර්ව අවසරය නොමැති ව සහ එසේ විකුණන හෝ බැහැර කරන වේලාවේදී ඒ ද්‍රව්‍ය සඳහා ගෙවිය යුතු තීරු බදු ප්‍රධාන අයකැමි වෙත ගෙවා තිබේ නම් මිස, විකිණීම හෝ අන් ලෙසකින් බැහැර කිරීම නො කළ හැකි අතර මේ අතුරු විධානයේ පෙරාතුව වූ විධිවිධාන කඩ කරමින් විකුණනු ලැබූ හෝ බැහැර කරනු ලැබූ යම් ද්‍රව්‍යයක් අහිමි කරනු ලැබීමට යටත් විය යුතු ය.".

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය මෙයින් ආදේශ කරනු ලැබේ :— *ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.*

*" ගාස්තු සමථය කිරීම.*

25. ලියාපදිංචි කළ ටොන් ප්‍රමාණයේ එක් එක් ටොන් එක සඳහා ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නිවේදනයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි ප්‍රමාණයක් අනුව මාස දොළහක් සඳහා වරාය ගාස්තු සමථය කිරීමට යම් වේලාන්ත නැවකට ඉඩ දෙනු ලැබිය යුතු අතර එය ගෙවනු ලැබූ විට අයකැමි හෝ සෙසු ප්‍රධාන නිලධරයා විසින්, ඒ යාත්‍රාව එසේ රැඳෙන, සහතිකයේ දැක්වෙන කාලය සඳහා යම් වැඩිදුර වරාය ගාස්තුවක් ඉල්ලනු ලැබීමෙන් නිදහස් කෙරෙන සහතිකයක් දිය යුතු ය.".

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :— *ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.*

" 27. ශ්‍රී ලංකාවේ යම් වරායකට හෝ ස්ථානයකට එන හෝ ශ්‍රී ලංකාවේ වෙරළ කරා ළඟා වෙන සියලු නැව් පිළිබඳව ද ඒ නැව්වල පටවා තිබෙන හෝ පටවා තිබෙන්නට ඇති සියලු බඩු පිළිබඳව ද, ශ්‍රී ලංකාවේ යම් වරායකට හෝ ස්ථානයකට යම් නැවකින් ගොඩ බෑ සියලු බඩු පිළිබඳව ද රේගු නිලධරයන් විසින් සම්පූර්ණයෙන් ම දැන සිටිය යුතු හෙයින් :

*වාර්තා කිරීමට ප්‍රථම කිසිම භාණ්ඩයක් ගොඩ බෑම හෝ තොග වෙන් කිරීම නොකළ යුතු බව.*

මෙහි මින් මතු විධාන කෙරෙන ආකාරයට නැව පිළිබඳ ව යථා පරිදි වාර්තා කිරීමට හා භාණ්ඩ ගොඩ බෑමේ අවසරය දීමට පෙර එතෙර යම් දේශයක සිට ළඟා වන යම් නැවකින් කිසි ම භාණ්ඩයක් ගොඩ නොබෑ යුතු බවට හා ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරය තුළට ඒ නැව පැමිණීමෙන් පසුව තොග වෙන් කිරීම නො කළ යුතු බව ද; මෙහි මින් මතු විධාන

ගොඩ බාන වෙලාවල් හා ස්ථාන සහ නිලධරයන්ගේ සැලකිල්ල. වාර්තා නොකළ හෝ සටහන් නොකළ බඩු අහිමි කළ යුතු බව. දණ්ඩනය.

කරනු ලබන පරිදි වූ නියමිත වේලාවලදී, නියමිත ස්ථානයන්හි, නියමිත ආකාරයකට, නියමිත තැනැත්තන් විසින්, නියමිත නිලධරයන්ගේ පාලනය යටතේ මිස කිසිම භාණ්ඩයක් එසේ ගොඩ නො බෑ යුතු බවද; යථා පරිදි වාර්තා නො කරනු ලැබූ හෝ මෙයට පටහැණි ව ගොඩ බෑ සියලු භාණ්ඩ අහිමි කළ යුතු බව ද; මෙයට පටහැණි ව, තොග වෙන් කරනු ලැබුවහොත් ඒ නැවේ නෞකාධිපති රුපියල් දෙදහසකට නො වැඩි මුදලකට අහිමි විය යුතු බව ද; ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරයට යම් නැවක් ලඟා වීමෙන් පසු ඒ නැවේ භාණ්ඩවල යම් කොටසක් ගොඩ බෑම පහසු කිරීම සඳහා ඒ නැවේ භාණ්ඩ ඇසිරීමේ යම් වෙනසක් කළහොත්, හෝ එහි යම් කොටසක් හිල් කළහොත්, විනාශ කළහොත් හෝ ඒ නැවෙන් පිටතට වීසි කළහොත් එසේත් නැතහොත් යම් ඇහිරිමක් විවෘත කළ හොත්, ඒ නැව තොග වෙන් කළ ලෙස සැලකිය යුතු බව ද මෙයින් පනවනු ලැබේ:

කාසි, රන් රිදී ඉලි, ගව ආදී සතුන් හා මගීන් අක්හැරීම.

එසේ වුව ද, සෑම අවස්ථාවක ම කාසි, රන් රිදී ගුලි, ගව ආදී සතුන් සහ වෙනත් පශු සම්පත් සහ මගීන් සහ ඔවුන්ගේ බඩුබාහිරාදිය වාර්තාවට, ප්‍රවේශයට හෝ ගොඩ බෑමේ අවසරයට පෙර ගොඩ බෑ හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

" ඇතුළු වීමේ අවසර පත්‍රයක් නොමැති නෞකාධිපතියකු හෝ නැව් බඩු, නැව් පත්‍ර හා අනුරූප නොවන හොත් හෝ නැවෙන් පිටතට යැවෙන භාණ්ඩ නියමිත ස්ථානවල ගොඩ, නොබෑව හොත් නෞකාධිපති වෙත පමුණුවනු ලබන දණ්ඩන.

32. පිටත් වූ ස්ථානයේ දී සාමාන්‍යයෙන් දෙනු ලබන ඇතුළු වීමේ අවසර පත්‍රයක් හෝ වෙනත් පත්‍රයක් නොමැති ව ශ්‍රී ලංකාවේ යම් වරායකට යම් නැවක් ළඟා වුවහොත් ඒ නැවේ නෞකාධිපති රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය. එසේ නැතහොත්, යම් නැවක් පිටත් වූ ස්ථානයේදී දෙනු ලැබූ යම් ඇතුළු වීමේ අවසර පත්‍රයක හෝ වෙනත් පත්‍රයක සඳහන් යම් භාණ්ඩයක් ඒ නැව තුළ නොමැති වී නම්, එසේත් නැතහොත් එහි එසේ තිබෙන ප්‍රමාණය අඩු වී ඒ අඩුව සම්බන්ධයෙන් යථා පරිදි වූ හේතු නොදැක්වී නම්, එසේත් නැතහොත් ඒ නැවෙන් පිටතට යවන ලද භාණ්ඩ නියමිත ස්ථානවල ගොඩ නො බානු ලැබේ නම්, ඒ නැති වුණු හෝ අඩු වුණු කරුණු නො දැක්වුනු භාණ්ඩ සම්බන්ධයෙන් ඒ නැවේ නෞකාධිපති, ඒ භාණ්ඩ තීරු බද්දට යටත් ව ඒ තීරු බද්ද සොයා දැන ගත හැකි නම්, රුපියල් පන්සියය සහ ඒ භාණ්ඩ සඳහා අය කළ හැකි තීරු බද්දේ දෙගුණයකට නො වැඩි මුදල යන දෙකෙන් වැඩි මුදල හෝ ඒ තීරු බද්ද සොයා දැන ගත නොහැකි නම්, නැතහොත් ඒ භාණ්ඩ තීරු බද්දට යටත් නොවේ

නම්, නැති වූ හෝ අඩු වූ එක් එක් බඩු මිටිය සඳහා රුපියල් දෙදහසයකට නො වැඩි මුදලක දණ්ඩනයක් වශයෙන් ගෙවීමට යටත් විය යුතු ය. තවද ඒ දණ්ඩන මුදල ගෙවන ලෙස නියම කිරීමටත් එය ගෙවීමට එසේ යටත් වී ඒ දණ්ඩන මුදල ගෙවීම ප්‍රතික්ෂේප කරන යම් යාත්‍රාවක නෞකාධිපතියකුට පිට වීමේ අවසර පත්‍රයක් දීම ප්‍රතික්ෂේප කිරීමටත් අයකැමිට බලය දෙනු ලැබේ:

එසේ වුව ද, ඇතුළු වීමේ අවසර පත්‍රයක් නොමැති විටකදී ඒ සම්බන්ධයෙන් කරුණු දැක්වීමට ඉඩ දීමෙන් හෝ සංශෝධිත වාර්තාවක් ඉදිරිපත් කිරීමෙන් පැහැදිලි වැරදි හරි ගැස්සීමට හෝ අහම්බෙන් හෝ ප්‍රමාද දෝෂයකින් වූ අඩු ලුහුඬු පිරවීමට තම අභිමතය පරිදි යම් නැවක නෞකාධිපතියකුට ඉඩ දීමෙන්, මෙහි සඳහන් කිසිවකින් අයකැමි කිසි විටෙකත් වළක්වන ලෙස තේරුම් නො ගත යුතු ය.".

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තියේ (1) වන උප වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් උප වගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය සංශෝධනය කිරීම.

"බඩු බෑමට සහ ජනරජයේ ඇදුම් වල තැන්පත් කිරීමට සහ ඉන් ඉවත් කිරීමට සම්බන්ධ විධිවිධාන හා නියමිත කාලය තුළ බඩු ඉවත් කිරීම පැහැර හැරීමේදී නියම කරනු ලබන දණ්ඩන.

(1) බඩු බෑම සඳහා අයකැමි විසින් අවසර පත්‍රයක් දෙනු ලැබී නම් මිස යම් නැවකින් කිසි ම භාණ්ඩයක් නො බෑ යුතු අතර ඒ අවසර පත්‍රයෙහි නියමිත හා ප්‍රකාශිත ස්ථානයන්හි හැර කිසි ම භාණ්ඩයක් ගොඩ නො බෑ යුතු ය. තවද එසේ ගොඩ බෑ භාණ්ඩ සියල්ල ජනරජයේ ගුදමට ගෙන ගොස් එහි තැන්පත් කළ යුතු ය. ගොඩ බෑ දින සිට සම්පූර්ණ දවස් තුනක් ඇතුළත ආනයනකරු විසින්, මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති ලෙසට වූ, විස්තරාත්මක හා සම්පූර්ණ බඩු සටහනක් ඉදිරිපත් කළ යුතු ය. තවද ඔහු විසින් ඒ භාණ්ඩ සඳහා අය විය යුතු සහ ගෙවිය යුතු සියලු තීරු බදු ගෙවිය යුතු ය. නැතහොත්, ඒ භාණ්ඩ යථා පරිදි ගුදම්වල තැන්පත් කළ යුතු ය. එසේත් නැතහොත්, ඒ භාණ්ඩ තීරු බදුවලින් නිදහස් නම්, ඒ බව එසේ සටහන් කළ යුතු ය. ඒ සටහන් කිරීම පැහැර හරිනු ලැබ ඒ භාණ්ඩ ඉහත කී ලෙස සම්පූර්ණ දවස් තුනක් ඇතුළත ඉවත් කරනු ලැබූ විටෙක, ඒ භාණ්ඩ ගුදමෙහි තිබූ කාලය තුළ ඒ භාණ්ඩ සඳහා 15 වන වගන්තිය යටතේ නියෝග මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි ප්‍රමාණානුකූල අතිරේක කුලියක් ගෙවීමට ඒ භාණ්ඩ යටත් කරනු ලැබිය යුතු ය. තවද ඒ අවසර පත්‍රය නොමැති ව හෝ ඒ අවසර පත්‍රයෙහි සඳහන් විධානවලට පටහැනි ව බෑ, ගොඩ බෑ හෝ ඉවත් කළ භාණ්ඩ සියල්ල අහිමි කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

" අඩුවෙන් අග යන ලද බඩු රඳවා තැබිය යුතු බව.

52. එසේ සටහන් කරන ලද භාණ්ඩ පරීක්ෂා කිරීමේදී එහි සැබෑ වටිනාකමට අනුකූලව ඒ භාණ්ඩ නො අගයන ලද බව රේගු නිලධාරයන්ට පෙනී ගියහොත්, ඒ නිලධරයන් විසින් ඒ භාණ්ඩ රඳවා තැබීම සහ නිසි නිලධරයන් විසින් තීරු බද්ද සඳහා ඒ භාණ්ඩ අවසාන වශයෙන් පරීක්ෂා කිරීමේ දින සිට දවස් දෙකක් ඇතුළත ඒ භාණ්ඩ ජනරජයේ ප්‍රයෝජනය සඳහා ගැනීම නීත්‍යනුකූල විය යුතු ය. තවද අයකැමි විසින්, විරායට දිනපතා ලැබෙන මුදලින් හෝ භාණ්ඩාගාරයෙන් ලබා ගත් අත්තිකාරමකින් හෝ ඒ ඇගැයිමේ මුදල ඒ භාණ්ඩ සඳහා ගෙවන ලද බදුත් සමග ඒ භාණ්ඩවල ආනයනකරු වෙත හෝ අයිතිකරු වෙත එහි සම්පූර්ණ ගෙවීම වශයෙන් ගෙවීමට සලස්වා ජනරජයේ ප්‍රතිලාභය සඳහා ඒ භාණ්ඩ බැහැර කළ යුතු ය. තවද ඒ විකිණීමෙන් ලැබෙන මුදල එසේ ගෙවන ලද මුදල සහ ජනරජය විසින් එසේ ගෙවන ලද මුදල් සහ දරන ලද සියලු ගාස්තු ඉක්මවී නම් ඒ අතිරික්තය අහිමි කිරීමක් ලෙස සලකනු ලැබ එය 153 වන වගන්තියෙහි විධිවිධාන සලස්වා ඇති පරිදි බැහැර කළ යුතු ය.".

ජනරජයේ ප්‍රතිලාභය සඳහා විකිණිය යුතු බව.

59අ වන අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 59 වන වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ඒ ප්‍රඥප්තියේ 59අ වන වගන්තිය වශයෙන් බල පැවැත්විය යුතු ය :—

" අපනයනකරුගේ වියදමින් භාණ්ඩ පරීක්ෂා කළ යුතු බව.

59අ. නැවට පැටවීමේ අපේක්ෂාවෙන් ගෙනා භාණ්ඩ කිසිවක් පරීක්ෂා කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය යයි අයකැමි විසින් හෝ රේගුවේ නිසි නිලධරයා විසින් සලකනු ලබන සියලු පියවර අපනයනකරු විසින් හෝ ඔහුගේ අනුයෝජිතයා විසින් තම වියදමින් හා තම වගකීම පිට ගත යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 62 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 62 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

" භාණ්ඩ නැවට පැටවීම සඳහා සාමාන්‍ය අවසර පත්‍රයක් අයකැමි විසින් දිය හැකි බව.

62. යම් නැවක පිටමන් සටහන කිරීමේදී, අවසර පත්‍රයෙයි ඉලක්කයිතව ම ව්‍යතිරික්ත භාණ්ඩ හැර, ශ්‍රී ලංකාවෙහි නිපදවන ලද හෝ සාදන ලද යම් වර්ගයකට අයත් භාණ්ඩ නැවට පැටවීම හා පැටවීම සඳහා සාමාන්‍ය අවසර පත්‍රයක් දිය යුතු ය :

එසේ වුවද, ඒ නැව පිටවීමේ අවසරය ලැබීමට පෙර, ඒ නැව තුළ වූ භාණ්ඩ කිසිවක් අපනයනකරු විසින්, ඒ භාණ්ඩවල ප්‍රමාණය, වර්ගය හා වටිනාකම පිළිබඳ නිරවද්‍ය විශේෂ විස්තරයක් ඇතුළත් සටහනක් අයකැමි වෙත භාර දිය යුතු ය. තව ද ඒ ප්‍රකාශය අසත්‍ය වුවහොත් හෝ නැවේ සන්ධාරයන් නෞකාධිපති විසින් භාර දීමට පෙර ඒ සටහන කිරීම ඒ අපනයනකරු විසින් පැහැර හරිනු ලැබුවහොත්, ඔහු රුපියල් හාර සියයකට නො වැඩි මුදලකට අහිමි විය යුතු අතර ඒ නැවට පිට වීමේ අවසර පත්‍රය දීමේදී ඒ නැව් භාණ්ඩ නොගය සහතික කිරීම අයකැමි විසින් ප්‍රතික්ෂේප කළ හැකි ය.".

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"ආපසු යාත්‍රා කිරීමේ අවසර පත්‍රය දීමෙන් පසු නිලධරයන් යාත්‍රා වලට නැඟිය හැකි බව.

64. ආපසු යාත්‍රා කිරීමේ අවසර පත්‍රය දීමට පෙර හෝ දීමෙන් පසු, ශ්‍රී ලංකාවේ යම් වරායක සීමා ඇතුළත හෝ ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරය ඇතුළත තිබෙන යම් නැවකට රේගු නිලධරයන් නැඟ, ආපසු යාත්‍රා කිරීමේ අවසර පත්‍රය සහ ආහාර ද්‍රව්‍ය සැපයුම් බිල ඉල්ලා සිටීම නීත්‍යනුකූල විය යුතු ය. තවද තීරු බද්දට යටත් වූ ද යථා පරිදි පිටමන් සටහන් නොකරනු ලැබූ ද භාණ්ඩ කිසිවක් ඒ නැව තුළ තිබුනහොත්, ඒ භාණ්ඩ ආපසු ගොඩ බා අහිමි කළ යුතු අතර ඒ අවසර පත්‍රයෙහි හෝ ආහාර ද්‍රව්‍ය සැපයුම් බිලෙහි ඇතුළත් භාණ්ඩ කිසිවක් ඒ නැව තුළ නො තිබුණහොත්, ඒ අවසර පත්‍රයෙහි හෝ ආහාර ද්‍රව්‍ය සැපයුම් බිලෙහි ඇතුළත් ව නැව් තුළ නො තුබූ සෑම බඩු මිටියක් හෝ පාර්සලයක් සඳහා ඒ නෞකාධිපති රුපියල් හාර සියයකට නො වැඩි මුදලකට අහිමි විය යුතු ය.".

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 82 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 82 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"අවුරුදු දෙකක් ඇතුළත භාණ්ඩ ඉවත් කළ යුතු බව.

82. ගුදම් කළ සියලු භාණ්ඩ, ඒ භාණ්ඩ ගුදම් කිරීමේ දින සිට අවුරුදු දෙකක් ඇතුළත මෙරටෙහි දී ප්‍රයෝජනයට ගැනීම හෝ අපනයනය කිරීම සඳහා ඉවත් කළ යුතු ය. නැතහොත් අයකැමි විසින් ඉඩ දිය හැකි වැඩිදුර කාලයක් ඇතුළත ඒ භාණ්ඩ ඉවත් කළ යුතු ය. එබඳු අවස්ථාවක දී නිසි නිලධරයන් විසින් ඒ භාණ්ඩ පරීක්ෂා කොට, ගොඩ බෑ විට සොයා දැනගත් ප්‍රමාණය හා ඒ පරීක්ෂණයේදී තිබෙන ලෙස සොයාගත් ප්‍රමාණය අතර ඇති යම් අඩුපාඩුවක් හෝ වෙනසක් සඳහා අය විය යුතු තීරු බදු කිසිවක්, ගුදම් කුලිය හා ඊට සම්බන්ධ අවශ්‍ය වියදම් ද සමඟ, ඒ සම්බන්ධයෙන් නීතියෙන්

අඩුපාඩු ආදිය වෙනුවෙන් තීරු බදු ගෙවිය යුතු බව.

අවසර ඇති ඉඩදීම්වලට යටත් ව, ගෙවිය යුතු අතර එසේ සොයාගත් ප්‍රමාණය, එහි එවකට හිමිකරුගේ හෝ අයිතිකරුගේ නමින්, පළමුවන ආනයනයේ ආකාරයෙන් ම නැවත ගුදම් කළ යුතු ය :

එසේ වුව ද, භාණ්ඩ කිසිවක් නරක් විය හැකි වේතැ යි අයකැමි සලකනු ලැබුවහොත් හෝ වෙන යම් හේතුවක් නිසා ඒ දැවුරුදු කාල සීමාව ඇතුළත යම් විටක දී ඒ භාණ්ඩ ඉවත් කරන ලෙස ඔහු විසින් නියම කළ හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 87 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

17. ප්‍රධාන ප්‍රඥප්තියේ 87 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"අඩුපාඩුවලට ඉඩ හැරීම සඳහා භාණ්ඩවල වටිනාකම රේගු නිලධරයන් විසින් තක්සේරු කළ යුතු බව.

87. වටිනාකම අනුව තීරු බද්ද ගෙවීමට යටත් කරනු ලැබිය හැකි භාණ්ඩවල යම් අඩුපාඩුවක් ඇති වූ කල්හි, එහි වටිනාකම රේගු නිලධරයන් විසින් තක්සේරු කරන ලද ඒ හා සමාන වර්ගයේ භාණ්ඩවල වටිනාකම විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 118 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 118 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"දේශීය ජල තීරයෙහි ගැවසෙන නැව්වලට නිලධරයන් ඇතුළු වී ඒවා වරාය තුළට ගෙන ආ හැකි බව.

118. ශ්‍රී ලංකාවේ යම් වරායක හෝ ස්ථානයක තිබෙන හෝ ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරය ඇතුළත ගැවසෙන යම් නැවකට රේගු නිලධරයන් ඇතුළු වී තහනම් කරනු ලැබ ඇති හා තීරු බදු නොගෙවූ භාණ්ඩ සඳහා ඒ නැවේ සියලු කොටස් අවුස්සා බැලීම සහ සෝදිසි කිරීම ද ඒ නැව ඒ වරායේ හෝ ස්ථානයේ හෝ ඒ දේශීය ජල තීරය ඇතුළත තිබෙන තාක් කල් ඒ නැව් තුළ නිදහසේ නතර වී සිටීම ද නීත්‍යනුකූල වන්නේ ය. එයින් යම් නැවක් අන් තැනකට යාමට නියමිත ව, නෞකාධිපතිට පිටව යන ලෙස නියම කිරීමෙන් පසු පැය විසි හතරක කාලයක් එසේ ගැවසීම නොකඩව කරන්නේ නම්, රේගු නිලධරයන් විසින් ඒ නැව වරාය තුළට ගෙනැවිත් එහි නැව් බඩු සෝදිසි කිරීම හා පරීක්ෂා කිරීම ද, නැව් බඩු සහ ගමන පිළිබඳව නෞකාධිපති පරීක්ෂා කිරීම ද නීත්‍යනුකූල වන්නේ ය. ශ්‍රී ලංකාවට ආනයනය කිරීම තහනම් කරනු ලැබ ඇති භාණ්ඩ කිසිවක් ඒ නැවෙහි තිබේ නම් ද ඒ පරීක්ෂණයේ දී නෞකාධිපතිගෙන් අසන ප්‍රශ්න වලට ඔහු සත්‍ය ලෙස පිළිතුරු නො දෙන්නේ නම් ද ඔහු රුපියල් දෙදහසකට නොවැඩි මුදලකට අහිමි විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 129 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 129 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

“නැවෙන් බා ඇති හෝ එසේ නො බෑ වුවද තහනම් කරනු ලැබ ඇති භාණ්ඩ හෝ සීමා කරනු ලැබ ඇති භාණ්ඩ ආනයනය කිරීමට සම්බන්ධව සිටින තැනැත්තන්වද ඒ භාණ්ඩ නැවෙන් බාන්නා වූ, සඟවා තබා ගන්නා වූ හෝ ඒ භාණ්ඩ භාරව සිටින්නා වූ තැනැත්තන්ට ද (ඒ භාණ්ඩවල) වටිනාකම මෙන් තෙගුණයක් හෝ රුපියල් දෙදහසක් අහිමිවිය යුතු බව.

**129.** තහනම් කරනු ලැබ ඇති භාණ්ඩ කිසිවක් හෝ ආනයනය කිරීම සීමා කරනු ලැබ ඇති භාණ්ඩ කිසිවක්, ඒ භාණ්ඩ නැවෙන් ගොඩ බා ඇතත් නැතත් ඒ තහනම් කිරීමට හෝ සීමා කිරීමට පටහැනිව ශ්‍රී ලංකාවට ආනයනය කිරීමට හෝ ගෙන ඒමට සම්බන්ධ වන්නා වූ සෑම තැනැත්තකු ද තහනම් කරනු ලැබ ඇති භාණ්ඩ කිසිවක් හෝ සීමා කරනු ලැබ ඒ සීමා කිරීමට පටහැනිව ආනයනය කරනු ලබන භාණ්ඩ කිසිවක් හෝ තීරුබදුවලට යටත් වූ ද තීරුබදු නොගෙවා ඇත්තා වූ හෝ තීරුබදු සහතික නොකරනු ලැබ ඇත්තා වූ ද භාණ්ඩ කිසිවක් නැවෙන් ගොඩ බාන්නා වූ, හෝ නැවෙන් ගොඩ බෑමෙහි ලා සහාය වන්නා වූ හෝ ඊට අන් ලෙසකින් සම්බන්ධ වන්නා වූ සෑම තැනැත්තකුම හෝ එබඳු භාණ්ඩ කිසිවක් තැන්පත් කර තිබිය හැකි යම් ගුදමකින් හෝ ආරක්ෂා ස්ථානයකින් තීරුබදු නොගෙවා නීති විරෝධී ලෙස ඉවත් කරනු ලැබ ඇති භාණ්ඩ කිසිවක් දැන දැන ම සඟවා තබා ගන්නා වූ, තබා ගන්නා වූ හෝ සඟවන්නා වූ, නැතහොත් එම භාණ්ඩ සඟවා තබා ගැනීමට, තබා ගැනීමට හෝ සැඟවීමට දැන දැන ම අවසර දෙන්නා වූ හෝ ඉඩ දෙන්නා වූ හෝ එසේ සඟවා තබා ගැනීම, තබා ගැනීම හෝ සැඟවීම සිදුකර වන්නා වූ හෝ කරවා ගන්නා වූ නැතහොත් එබඳු භාණ්ඩ කිසිවක් දැන දැන ම හස්තප්‍රාප්ත කරගන්නා වූ හෝ ඒ භාණ්ඩ කිසිවක සන්තකය දැන දැන ම ලබන්නා වූ, නැතහොත් ඉහත දැක්වෙන පරිදි භාණ්ඩ කිසිවක් තැන්පත් කරනු ලැබ තිබිය හැකි යම් ගුදමකින් හෝ ආරක්ෂා ස්ථානයකින් ඒවා නීති විරෝධී ලෙස ඉවත් කිරීමෙහි ලා සහාය වන්නා වූ හෝ ඊට සම්බන්ධ වන්නා වූ, නැතහොත් භාණ්ඩ කිසිවක තීරු බද්දෙන් ලැබෙන ආදායම හෝ එහි යම් කොටසක් වංචා කිරීමේ අදහසින් තීරුබදුවලට යටත් එම භාණ්ඩ ගෙනයාමෙහි ලා, ඉවත් කිරීමෙහි ලා, තැන්පත් කිරීමෙහි ලා, සැඟවීමෙහි ලා හෝ යම් ආකාරයකින් ඒවා සම්බන්ධයෙන් කටයුතු කිරීමෙහි ලා දැන දැන ම සම්බන්ධ වන්නා වූ, නැතහොත් ඒ තීරුබදුවලින් හෝ එහි යම් කොටසක් වංචනිකව මගහැරීමෙහි ලා හෝ එසේ මගහැරීමට තැත් කිරීමෙහි ලා දැන දැන ම යම් ලෙසකින් සම්බන්ධ වන්නා වූ සෑම තැනැත්තකු ඉහත දැක්වෙන එක් එක් හා සෑම අවස්ථාවක දී ම, රේගු අයකැමිගේ කැමැත්ත පරිදි, එකී භාණ්ඩ

වල වටිනාකම මෙන් තෙගුණයකට අහිමි විය යුතු ය ; නැතහොත් රුපියල් දෙදහසක දණ්ඩනයකට යටත් විය යුතු ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 130 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

20. ප්‍රධාන ප්‍රඥප්තියේ 130 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

" තහනම් කරනු ලැබ ඇති හෝ සීමා කරනු ලැබ ඇති භාණ්ඩ අපනයනය කිරීමෙහි ලා සම්බන්ධ ව සිටින තැනැත්තන්.

130. තහනම් කරනු ලැබ ඇති භාණ්ඩ කිසිවක් හෝ අපනයනය කිරීම සීමා කරනු ලැබ ඇති භාණ්ඩ කිසිවක් ඒ භාණ්ඩ නැව්ගත කිරීම සඳහා පටවා ඇතත් නැතත් එම තහනම් කිරීමට හෝ සීමා කිරීමට පටහැනි ව ශ්‍රී ලංකාවෙන් පිටතට අපනයනය කිරීමෙහි ලා හෝ ගෙන යාමෙහි ලා හෝ ශ්‍රී ලංකාවෙන් පිටතට අපනයනය කිරීමට හෝ ගෙන යාමට තැත් කිරීමෙහි ලා සම්බන්ධ වන්නාවූ සෑම තැනැත්තකු ම සහ තීරු ගාස්තුවලට යටත් වූ ද තීරු ගාස්තු නොගෙවා ඇත්තා වූ හෝ තීරු ගාස්තු සහතික නොකොට ඇත්තා වූ ද භාණ්ඩ කිසිවක් අපනයනය කරන්නා වූ හෝ අපනයනය කිරීමට තැත් කරන්නා වූ හෝ තීරු ගාස්තුවලට යටත් භාණ්ඩ කිසිවක තීරු බදුවලින් ලැබෙන ආදායම හෝ එහි යම් කොටසක් වංචා කිරීමේ අදහසකින් එම භාණ්ඩ සම්බන්ධයෙන් යම් ආකාරයකින් කටයුතු කරන්නා වූ හෝ එම තීරු බදුවලින් හෝ එහි යම් කොටසක් වංචනිකව මග හැරීමෙහි ලා හෝ එලෙස මග හැරීමට තැත් කිරීමෙහි ලා දැන දැන ම සම්බන්ධ වන්නා වූ සෑම තැනැත්තකු ම ඉහත දැක්වෙන එක් එක් හා සෑම අවස්ථාවකදී ම, රේගු අයකැමිගේ කැමැත්ත පරිදි, ඒ භාණ්ඩවල වටිනාකම මෙන් තෙගුණයකට අහිමි විය යුතු ය ; නැතහොත් රුපියල් දෙදහසක දණ්ඩනයකට යටත් විය යුතු ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 132 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

21. ප්‍රධාන ප්‍රඥප්තියේ 132 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

" පරීක්ෂා කිරීමට පෙර භාණ්ඩ ඉවත් කරනු ලැබුව හොත්, ඉවත් කිරීමට සම්බන්ධ පාර්ශ්වකරුවන් දණ්ඩනයට යටත් විය යුතු බව.

132. යම් නැවකින්, වරාය වේදිකාවකින්, වාප්පුවකින් හෝ වෙනත් ස්ථානයකින් ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලැබූ භාණ්ඩ කිසිවක් නිසි රේගු නිලධරයාගේ භාරය හා අධිකාරය යටතේ මිස, ඒ නිලධරයා විසින් පරීක්ෂා කරනු ලැබීමට පෙර, ඉවත් කරන්නා වූ සහ එම භාණ්ඩ පිළිබඳව නිසි නිලධරයා විසින් ප්‍රමාණවත් ගණන් ගැනීමක් නොකෙරෙන පරිදි, නැතහොත් ඒ භාණ්ඩ නිසි ලෙස ගුදම්ගත නොකෙරෙන පරිදි, ගොඩ බෑමෙන් පසු ගුදම් කරනු ලැබීම පිණිස සටහන් කරනු ලැබූ භාණ්ඩ කිසිවක් යම් වරාය වේදිකාවකින්, වාප්පුවකින් හෝ වෙනත් ස්ථානයකින් ඉවත් කරන්නා

වූ හෝ අස් කර ගන්නා වූ සහ එසේ ඉවත් කිරීමෙහි ලා හෝ අස් කර ගැනීමෙහි ලා සහාය වන්නා වූ හෝ අන් ලෙසකින් ඊට සම්බන්ධ වන්නා වූ හෝ එබඳු භාණ්ඩ කිසිවක් දැන දැන ම සඟවා තබා ගන්නා වූ, තබා ගන්නා වූ හෝ සඟවන්නා වූ නැතහොත් එම භාණ්ඩ සඟවා තබා ගැනීමට, තැබීමට හෝ සැඟවීමට දැන දැන ම අවසර දෙන්නා වූ හෝ ඉඩ දෙන්නා වූ හෝ එසේ සඟවා තබා ගැනීම, තබා ගැනීම හෝ සැඟවීම සිදු කරවන්නා වූ හෝ කරවාගන්නා වූ හෝ දැන දැන ම එම භාණ්ඩවල සන්තකය ලබන්නා වූ සෑම තැනැත්තකුම භාණ්ඩවල වටිනාකම මෙන් තෙගුණයකට අහිමි විය යුතු ය ; එසේ නැතහොත් ඒ සෑම තැනැත්තකු ම රුපියල් දෙදහසක දණ්ඩනයකට යටත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 133 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

22. ප්‍රධාන ප්‍රඥප්තියේ 133 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

ඒ භාණ්ඩ නැවෙන් බෑමේ දී හෝ සඟවා තබා ගැනීමේ දී සහාය වන තැනැත්තන් (ඒ භාණ්ඩවල) වටිනාකම මෙන් තෙගුණයකට හෝ රුපියල් දෙදහසකට යටත් විය යුතු බව.

133. ඒ භාණ්ඩ නැවෙන් බෑමේදී, ගොඩබෑමේදී හෝ ඉවත් කිරීමේදී හෝ ඒ භාණ්ඩ සඟවා තබා ගැනීමේදී සහාය වන්නා වූ නැතහොත් වෙනත් ආකාරයකින් සම්බන්ධ වන්නා වූ හෝ ඒ භාණ්ඩ දැන දැන ම හස්තප්‍රාප්ත කර ගන්නා වූ හෝ ඒ භාණ්ඩවල සන්තකය දැන දැන ම ලබන්නා වූ සෑම තැනැත්තකු ම, රේගු අයකැමිගේ කැමැත්ත පරිදි, ඒ භාණ්ඩවල වටිනාකම මෙන් තෙගුණයකට අහිමි විය යුතු ය. නැතහොත් ඒ සෑම තැනැත්තකු ම රුපියල් දෙදහසක දණ්ඩනයකට යටත් විය යුතු ය ; තවද ඒ දණ්ඩනය අය කර ගැනීම පිණිස ඉදිරිපත් කළ යුතු යම් තොරතුරක, ඒ තොරතුරෙහි සඳහන් මුදල සඳහා නඩු පැවරීමට රේගු අයකැමි කැමැත්ත පළ කර ඇති බව කියැවෙන ප්‍රකාශය, ඒ කරුණ පිළිබඳ අන් කිසි හෝ අතිරේක සාක්ෂි නො මැතිව, ඒ කැමැත්ත පළ කිරීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් සාක්ෂි වශයෙන් සැලකිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 136 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

23. ප්‍රධාන ප්‍රඥප්තියේ 136 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

" පොලිස් නිලධරයා විසින් නතර කරන ලද හෝ ගන්නා ලද භාණ්ඩ.

136. මේ ආඥාපනත යටතේ අහිමි කිරීමට යටත් යම් භාණ්ඩ යම් පොලිස් නිලධරයකු විසින් හෝ ග්‍රාම සේවකයකු විසින් හෝ නතර කරනු ලබන්නේ නම් හෝ ගනු ලබන්නේ නම් ඒ භාණ්ඩ නතර කරනු ලැබූ හෝ ගනු ලැබූ ස්ථානය ළඟම ඇති රේගුවට ගෙන ගොස් ඒ භාණ්ඩ නතර කරනු ලැබීමෙන් හෝ ගනු ලැබීමෙන් පසු යුක්ති සහගත කාලයක් තුළ දී එම භාණ්ඩ බාර ගැනීමට පත් කරන ලද

2—ළ 09130—(74/08)

හිසි නිලධරයාට බාර දිය යුතු ය ; තව ද, ඒ භාණ්ඩ නතර කළ යම් පොලිස් නිලධරයකු හෝ ග්‍රාම සේවකයකු එම භාණ්ඩ යුක්ති සහගත කාලයක් තුළ දී රේගුවට ගෙන යාම පැහැර හරිනු ලබන්නේ නම් ඒ පොලිස් නිලධරයා හෝ ග්‍රාම සේවක රුපියල් දෙසියයකට නොවැඩි මුදලකට අහිමි විය යුතුය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 141 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

24. ප්‍රධාන ප්‍රඥප්තියේ 141 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"සෝදිසි කිරීම සම්බන්ධයෙන් විෂමාචාරය සඳහා නිලධරයන්ට දණ්ඩනය.

141. එයින් යම් නිලධරයකු විසින්, සැහෙන කාඩ් නමකින් එම තැනැත්තා එම මහේස්ත්‍රාත්වරයා, අයකැමි හෝ අනෙක් ජ්‍යෙෂ්ඨ රේගු නිලධරයා වෙත ගෙන යා යුතු යැයි නියම කර ඇති කල්හි, එසේ ගෙන නොයන්නේ නම් හෝ යම් තැනැත්තකු වෙත රේගු ගාස්තු නොගෙවූ හෝ තහනම් බඩු ඒ තැනැත්තා ළඟ තිබේ යැයි සිතීමට සැහෙන හේතු නොමැතිව තමා විසින් එම තැනැත්තා සෝදිසි කරනු ලැබීමට යටත් විය යුතු යයි යම් තැනැත්තකුට නියම කරන්නේ නම්, එම නිලධරයා රුපියල් දෙසියයකට නොවැඩි මුදලකට අහිමි විය යුතු අතර ඒ නිලධරයා ඒ මුදල ගෙවිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 143 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

25. ප්‍රධාන ප්‍රඥප්තියේ 143 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"නියම කරනු ලැබූ විට ගෙන ඒමට අපොහොසත් වන යාත්‍රා වලට වෙඩි තැබීමේ බලතල.

143. (1) මේ ආඥාපනත යටතේ තහනම් කරනු ලැබීමට හෝ පරීක්ෂා කරනු ලැබීමට යටත් වන හෝ රේගු නිලධරයන්ට ඇතුළු වීමට මේ ආඥාපනතින් බලය පැවරී ඇති යම් නැවක් හෝ බෝට්ටුවක් ගෙන එන ලෙස නියම කරනු ලැබූ විට එසේ ගෙන එනු නොලබන කල්හි—

(අ) එම නැවෙහි හෝ බෝට්ටුවෙහි අධිපති රුපියල් පන්සියයක මුදලකට අහිමි විය යුතු ය ;

(ආ) ශ්‍රී ලංකාවේ රේගු ධජය දරන්නා වූ යම් යාත්‍රාවක් භාරව සිටින හෝ ඒ යාත්‍රාවේ පාලනය භාර රේගු නිලධරයකු විසින් පළමුව සංඥාවක් වශයෙන් තුවක්කුවකින් වෙඩි තැබීමට සළස්වා, එම නැව හෝ බෝට්ටුව දෙසට හෝ තුළට වෙඩි තැබීම නීත්‍යානුකූල වන්නේ ය; තවද එම රේගු නිලධරයා හෝ ඔහුට උපකාර පිණිස හෝ සහාය පිණිස හෝ ඔහුගේ විධානය පරිදි හෝ ක්‍රියා කරන්නා වූ වෙනත් යම් තැනැත්තෙක් මේ වගන්තියෙන් පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා

කරනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් සිවිල් නඩුවක හෝ අපරාධ නඩුවක වන්දියකින් හෝ වගකීමකින් නිදහස් විය යුතු අතර, මෙයින් එසේ නිදහස් කරනු ලබන්නේ ය :

එසේ වුව ද මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවලින් යම් රේගු නිලධරයකු වෙත පැවරී ඇති බලතල තත් කාලයෙහි ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරය ඇතුළත තිබෙන්නා වූ නැවක් හෝ බෝට්ටුවක් සම්බන්ධයෙන් මිස, ක්‍රියාත්මක නොකළ යුතු ය.

(2) අයකැමි විසින් තත් කාර්යය සඳහා යථා පරිදි බලය පවරනු ලැබූ යාත්‍රාවක් නොවන වෙනත් යම් යාත්‍රාවක් ශ්‍රී ලංකා රේගු ධජය දරන අවස්ථාවක, එම යාත්‍රාවේ අධිපති හෝ එය භාරව සිටින තැනැත්තා වරදක් කරන අතර, ඔහු රුපියල් දෙසියයකට නොවැඩි දඩයකට යටත් වන්නේ ය.

(3) මේ වගන්තියෙහි " ශ්‍රී ලංකා රේගු ධජය " යන්නෙන් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දැන්වීමක් මගින් ශ්‍රී ලංකාවේ රේගු ධජය විය යුතු යයි ප්‍රධාන රේගු අයකැමි විසින් නිශ්චය කරනු ලබන මෝස්තරයක හෝ විස්තරයක වූ ධජයක් අදහස් වේ. ".

26. ප්‍රධාන ප්‍රඥප්තියේ 146 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :— *ප්‍රධාන ප්‍රඥප්තියේ 146 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.*

*'ආඥාපනතෙහි යම් වගන්තියක්' යටතේ අහිමි කරනු ලැබීමකට හෝ දඩයකට යටත් වන්නා වූ තැනැත්තකු වරදකට වරදකරුවකු වන බව.*

146. යම් තැනැත්තකු යම් ක්‍රියාවක හෝ පැහැර හැරීමක හේතුවෙන් මේ ආඥාපනතෙහි යම් වගන්තියක් යටතේ යම් භාණ්ඩ හෝ යම් මුදල් ප්‍රමාණයක් අහිමි කරනු ලැබීමකට හෝ දඩයක් නොවන වෙනත් යම් දණ්ඩනයකට හෝ යටත් වන්නේ නම් එයට අමතරව එම තැනැත්තා වරදකට වරදකරු වන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ නඩු විභාගයකින් පසු වරදකරු වූ විට—

(අ) අහිමි කරනු ලැබීමට හෝ දණ්ඩනයට ඔහු යටත් වූයේ යම් ක්‍රියාවක හෝ පැහැර හැරීමක හේතුවෙන් ද එය යම් නිශ්චිත භාණ්ඩ ආනයනයට හෝ අපනයනයට අදාළ වන්නේ නම් මාස හයකට නොඅඩු සහ අවුරුදු දෙකකට නොවැඩි කාලයක් සඳහා දෙආකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට සහ රුපියල් දස දහසකට නොවැඩි දඩයකට ද ;

(ආ) එම ක්‍රියාව හෝ පැහැර හැරීම එවැනි ආනයනයකට හෝ අපනයනයකට අදාළ නොවන්නේ නම් අවුරුදු දෙකකට නොවැඩි කාලයක් සඳහා දෙආකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් දස දහසකට නොවැඩි දඩය කට හෝ එම බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකටම ද යටත් විය යුතු ය :

එසේ වුව ද, අවසථාවෝචිත පරිදි අභිමිකිරීම හෝ දණ්ඩනය නියම කරනු ලැබුව ද නොලැබුව ද ඒ තැනැත්තාගෙන් එම අභිමිකිරීම හෝ දණ්ඩනය අයකර ගත නොහැකි යයි හෝ අයකර ගත නොහැකි විය හැකි යයි හෝ ප්‍රධාන රේගු අයකැමිගේ මතය වුවහොත් මිස, මේ වගන්තිය යටතේ කිසිම තැනැත්තකුට විරුද්ධව නඩු නොපැවරිය යුතු ය.

මේ වගන්තියෙහි "නිශ්චිත භාණ්ඩ" යන්නෙන් අමාත්‍යවරයා විසින් මේ වගන්තිය යටතේ කරන ලද යම් නිවේදනයක නිශ්චිත ව සඳහන් කරන ලද භාණ්ඩ අදහස් වේ.'.

147අ වන අලුත් වගන්තියක් ප්‍රධාන ප්‍රඥප්තියේ ඇතුළත් කිරීම.

27. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 147 වන වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් වගන්තිය මෙයින් ඇතුලත් කරනු ලබන අතර එය එම ප්‍රඥප්තියෙහි 147අ වන වගන්තිය වශයෙන් බල පවත්වන්නේ ය :—

"මේ ආඥාපනත යටතේ වූ වැරදි සම්බන්ධයෙන් නියමිත යම් දඬුවමක් නියම කිරීමට මහේස්ත්‍රාත්වරයන්ට අධිකරණ බලය ඇති බව.

147අ. යම් ලිඛිත නීතියක මීට පටහැනි විධිවිධාන ඇත්තේ වුව ද, මේ ආඥාපනත යටතේ වූ යම් වරද කට වරදකරු වන කවර තැනැත්තකුට වුව ද, එම වරද සඳහා නියමිත යම් දඬුවමක් නියම කිරීමට මහේස්ත්‍රාත්වරයකුට අධිකරණ බලය ඇත්තේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 152 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

28. ප්‍රධාන ප්‍රඥප්තියේ 152 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"ඔප්පු කිරීමේ භාරය පාර්ශ්වකරු වෙත පැවරෙන බව යනාදිය.

152. (1) බදු නොගෙවීම සම්බන්ධයෙන් හෝ අභිමි කිරීමේ වෙන යම් හේතුවක් සම්බන්ධයෙන් භාණ්ඩ කිසිවක් තහනම් කරනු ලැබූ විට, සිවිල්, අපරාධ හෝ වෙනත් යම් නඩු කටයුත්තක දී ඒ භාණ්ඩ සඳහා තීරු බදු ගෙවා තිබේ ද නැතහොත් ඒ භාණ්ඩ නීත්‍යානුකූලව ආනයනය කර තිබේ ද එසේත් නැතහොත් ඒ භාණ්ඩ නීත්‍යානුකූලව පට වන ලද ද හෝ අපනයනය කරන ලද ද යන්න පිළිබඳව යම් ප්‍රශ්නයක් මතු වුවහොත් එය ඔප්පු කිරීමේ භාරය ඒ භාණ්ඩවල අයිතිකරු වෙත හෝ ඒවාට හිමිකම් පාන්නා වෙත හෝ මේ ආඥාපනත පිළිබඳව යම් කඩකිරීමක් කරන ලදැයි චෝදනා

නගා ඇත්තේ යම් තැනැත්තකුට විරුද්ධව ද ඒ තැනැත්තා වෙත පැවරෙන අතර, ඒ භාරය නීතිපතිවරයා වෙත හෝ ඒ භාණ්ඩ තහනම් කළ හෝ නවතා ගත් නිලධරයා වෙත හෝ චෝදක පක්ෂය වෙත නොපැවරෙන්නේ ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියෙහි සඳහන් යම් නඩු කටයුත්තක දී භාණ්ඩ කිසිවක් ශ්‍රී ලංකාවෙන් අපනයනය කිරීමට හෝ ශ්‍රී ලංකාවෙන් පිටතට ගෙන යෑමට තැතක් දරා තිබේ ද යන ප්‍රශ්නය මතු වුවහොත්, ඒ භාණ්ඩ ශ්‍රී ලංකාවෙන් අපනයනය කිරීමට හෝ ශ්‍රී ලංකාවෙන් පිටතට ගෙන යෑමට අදහස් කරන ලදැයි හඟවන ප්‍රමාණවලින් නැතහොත් එසේ හඟවන ආකාරයකින් අසුරනු ලැබ වෙරළේ හෝ ඒ අසළ හෝ යම් ගඟක ඉවුරෙහි හෝ ඒ අසළ හෝ යම් ස්ථානයක තිබී සොයා ගන්නා ලද්දේ නම්, ඒ භාණ්ඩ ශ්‍රී ලංකාවෙන් අපනයන කිරීමට හෝ ශ්‍රී ලංකාවෙන් පිටතට ගෙන යෑමට තැතක් දරන ලද භාණ්ඩ වශයෙන් පූර්ව නිගමනය කළ යුතු ය.

(3) මේ වගන්තියේ (1) වන උපවගන්තියෙහි සඳහන් යම් නඩු කටයුත්තක දී, සහතිකයෙහි සඳහන් භාණ්ඩ ආනයනය කරන ලද භාණ්ඩ බව තමාගේ මතය යයි කියැවෙන ප්‍රධාන රේගු අයකැමිගේ හෝ නියෝජ්‍ය රේගු අයකැමිගේ අත්සන යටතේ යයි සැලකෙන සහතිකයක් එම භාණ්ඩ ආනයනය කරන ලද භාණ්ඩ බවට මුල් බැල්මට පිළිගත හැකි සාක්ෂිය විය යුතු අතර, එම භාණ්ඩ සහතිකය එය එසේ අත්සන් කර තිබෙන බවට තවදුරටත් කිසියම් සාක්ෂියක් නොමැතිව සාක්ෂි වශයෙන් පිළිගත යුතු ය ; තව ද, එකී මතය ප්‍රකාශ කරන ලද්දේ කවර හේතුවක් නිසා දැයි එළිදරව් කරන ලෙස ප්‍රධාන රේගු අයකැමිට හෝ නියෝජ්‍ය රේගු අයකැමිට හෝ නියම කිරීමට යම් අධිකරණය කට බලය නැත්තේ ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 154 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**29.** ප්‍රධාන ප්‍රඥප්තියේ 154 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

“තහනමට ගත් භාණ්ඩ, මාසයක දී ඒවාට හිමිකම් පෑමක් නොලද හොත් නුසුදුසු බවට ප්‍රකාශ කොට ඒවා සම්බන්ධයෙන් ඒ අනුව ක්‍රියා කළ යුතු බව.

154. (1) මේ ආඥාපනත යටතේ අහිමි කරන ලද සේ තහනමට ගනු ලැබූ හෝ මින් මතු එසේ තහනමට ගනු ලබන සියලු නැව්, බෝට්ටු, භාණ්ඩ සහ වෙනත් දේ, තහනමට ගනු ලැබුවේ යම් තැනැත්තකුගෙන් ද එම තැනැත්තා හෝ ඒවායේ අයිතිකරු හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ යම් තැනැත්තකු හෝ විසින් පෙර කී පරිදි තහනමට ගනු ලැබූ නැව, බෝට්ටුව, භාණ්ඩ හෝ වෙනත් දේ සම්බන්ධයෙන් හිමිකම් පෑමක් කිරීමට තමා අදහස් කරන බවට ඒවා තහනමට ගනු ලැබූ දින සිට

මාසයක් ඇතුළත ළඟම පිහිටි වරායේ අයකැමි හෝ රේගුවේ අනෙක් ප්‍රධාන නිලධරයා වෙත ලියවිල්ලකින් වූ දැන්වීමක් කර, එය භාර ගැනීමට අධිකරණ බලය ඇති අධිකරණය ඉදිරියේ එම හිමිකම් පෑම තහවුරු කිරීම සඳහා නඩු පැවරීමට සහ එසේ නොවුවහොත් අධිකරණයේ තීන්දුව ඉෂ්ට කර තහනමට ගැනීම කරන ලද ස්ථානයේ හෝ ඒ ස්ථානයට ආසන්නතම හෝ වරායෙහි සිටින අයකැමි හෝ නිසි රේගු නිලධරයා විසින් ප්‍රමාණවත් යයි සලකනු ලබන ගාස්තු ගෙවීමට වැඩිදුරටත් මුදලින් ඇපයක් ඉදිරිපත් කරනු ලැබුවහොත් මිස, එම නැව්, බෝට්ටු, භාණ්ඩ සහ වෙනත් දේ නුසුදුසු යයි ප්‍රකාශිත දේ ලෙස සලකා එසේ පිළිගත යුතු අතර, එම ආඥාපනත කඩ කිරීම නිසා තහනමට ගෙන නුසුදුසු යයි ප්‍රකාශිත නැව්, බෝට්ටු, භාණ්ඩ සහ වෙනත් දේ සම්බන්ධයෙන් නීතියෙන් විධාන කර ඇති ආකාරයට ඒවා සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු ය. පෙර කී පරිදි දැන්වීමේ සහ ඇපදීමේ දින යෙහි සිට දින තිහක් ඇතුළත දී, එසේ හිමිකම් පෑ නැව, බෝට්ටුව, භාණ්ඩ හෝ වෙනත් දේ ලබා ගැනීම පිණිස නිසි අධිකරණයෙහි නඩු පවරනු නොලැබුවහොත් තහනමට ගනු ලැබූ නැව, බෝට්ටුව, භාණ්ඩ හෝ වෙනත් දේ අහිමි වූ ලෙස සැලකිය යුතු අතර අයකැමි හෝ වෙනත් නිසි රේගු නිලධරයකු විසින් ඒවා සම්බන්ධයෙන් එපරිද්දෙන් ක්‍රියා කළ යුතු ය.

(2) නිසි අධිකරණයෙහි නඩු කටයුතු ඇරඹීමෙන් පසු, තහනමට ගනු ලැබූ දේ හෝ එහි වටිනාකම හෝ ආපසු දෙන බවට තහනමට ගැනීම කරන ලද ස්ථානයේ හෝ ඒ ස්ථානයට ආසන්නතම හෝ වරායෙහි සිටින අයකැමි හෝ නිසි රේගු නිලධරයා විසින් ප්‍රමාණවත් යයි සලකනු ලබන ඇප මුදලක් හිමිකම් පාන්නා විසින් දෙනු ලැබ, තහනමට ගනු ලැබූ නැව, බෝට්ටුව, භාණ්ඩ හෝ වෙනත් දේ ඔහු වෙත භාර දෙන ලෙස ඉල්ලා සිටිනු ලැබුවහොත්, ප්‍රධාන රේගු අයකැමිගේ හෝ නියෝජ්‍ය රේගු අයකැමියකුගේ අභිමතය පරිදි එය ඒ හිමිකම්පාන්නා වෙත එසේ භාර දිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 167 වන වගන්තිය සංශෝධනය කිරීම.

30. 1966 අංක 34 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 167 වන වගන්තියේ "තොග වෙළඳ පොළේ සැබෑ වටිනාකම" යන්නෙහි අර්ථකථනය වෙනුවට පහත දැක්වෙන අලුත් අර්ථකථනය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

' "සැබෑ වටිනාකම"—

(අ) නීත්‍යනුකූලව ආනයනය කළත් අන් ලෙසකින් ආනයනය කළත් ආනයනය කළ භාණ්ඩවලට අදාළ ම ගත් කල්හි පිළිවෙළින් බඩු විකුණුම්කරු හා ගැනුම්කරු ලෙස මුත්,

දෙදෙනා අතර එකිනෙකාගේ ව්‍යාපාරය කෙරෙහි කිසිදු සම්බන්ධතාවක් නැති අපනයනය කළ රටෙහි නිදහස් විකුණුම්කරුවකු හා ශ්‍රී ලංකාවෙහි නිදහස් ගැනුම්කරුවකු අතර සාමාන්‍යයෙන් ඒ භාණ්ඩ හෝ ඒ හා සමාන භාණ්ඩ ආනයනය කළ වේලාවේ දී හා ස්ථානයේ දී ඒවා ගෙන ගොස් භාර දීම පිණිස විකුණු හෝ විකිණීමට ඉදිරිපත් කළ හෝ මිල එසින් අදහස් වේ ; තවද,

(ආ) නීත්‍යනුකූලව අපනයනය කළත් අන් ලෙසකින් අපනයනය කළත් අපනයනය කළ භාණ්ඩවලට අදාළ ව නීත්‍යනුකූල ව අපනයනය කිරීමට තැත් කළත්, අන් ලෙසකින් අපනයනය කිරීමට තැත් කළත් අපනයනය කිරීමේ තැතට ලක්වූ භාණ්ඩවලට අදාළව ද ගත් කල්හි, පිළිවෙලින් ඒ භාණ්ඩවල විකුණුම්කරු හා ගැනුම්කරු වශයෙන් හැර දෙදෙනා අතර එකිනෙකාගේ ව්‍යාපාරය කෙරෙහි කිසිදු සම්බන්ධතාවක් නැති, ශ්‍රී ලංකාවෙහි නිදහස් විකුණුම් කරුවකු හා ආනයනය කළ රටෙහි නිදහස් ගැනුම්කරුවකු අතර සාමාන්‍යයෙන් ඒ භාණ්ඩ හෝ ඒ හා සමාන භාණ්ඩ අපනයනය කළ වේලාවේ දී හා ස්ථානයේ දී ඒවා ගෙන ගොස් භාර දීම පිණිස විකුණු හෝ විකිණීමට ඉදිරිපත් කළ හෝ මිල එසින් අදහස් වේ.'.

31. 1966 අංක 29 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 'අ' උපලේඛනයෙහි පූර්විකාව මෙයින් අත් හරිනු ලබන අතර, ඒ වෙනුවට පහත සඳහන් අලුත් පූර්විකාව ආදේශ කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 'අ' උපලේඛනය සංශෝධනය කිරීම.

"ආනයන තීරු බදු

යම් භාණ්ඩ, නිෂ්පාදිත භාණ්ඩ හෝ වෙළඳ භාණ්ඩ සඳහා වරණ ප්‍රමාණයක හෝ සාමාන්‍ය ප්‍රමාණයක තීරු බද්දක් මේ උපලේඛනයෙහි නියම කර ඇති කවර අවස්ථාවක වුව ද කලින් කල අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් නිශ්චය කොට දැක්විය හැකි රටක හෝ රටවල්වල පමණක් නිෂ්පාදනය කරනු ලැබ හෝ සාදනු ලැබ එහි සිට ම ගෙන්වනු ලැබූ බවට ප්‍රධාන රේගු අයකැමි සෑහීමට පත්වන පරිදි ඔප්පු කරනු ලැබූ භාණ්ඩ නිෂ්පාදිත භාණ්ඩ සහ වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන්, 10 වන වගන්තිය යටතේ යම් යෝජනා සම්මුතියක නියමයන්ට යටත් ව වරණ ප්‍රමාණය නියම කොට අය කළ යුතු ය.".

ජාතික රාජ්‍ය සභාවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.